Diploma Programme
Programme du diplôme
Programa del Diploma

# Sinhalese A: literature – Standard level – Paper 2
# Singhalais A : littérature – Niveau moyen – Épreuve 2
# Singalés A: literatura – Nivel medio – Prueba 2

Thursday 5 May 2016 (afternoon)
Jeudi 5 mai 2016 (après-midi)
Jueves 5 de mayo de 2016 (tarde)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

## Instructions to candidates

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the part 3 works you have studied and compare and contrast these works in response to the question. Answers which are not based on a discussion of at least two part 3 works will not score high marks.
- You are not permitted to bring copies of the works you have studied into the examination room.
- The maximum mark for this examination paper is **[25 marks]**.

## Instructions destinées aux candidats

- N’ouvrez pas cette épreuve avant d’y être autorisé(e).
- Traitez un seul sujet de composition. En basant votre réponse sur au moins deux des œuvres de la troisième partie que vous avez étudiées, vous devez comparer et opposer ces œuvres dans le cadre du sujet. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la troisième partie n’obtiendront pas une note élevée.
- Vous n’êtes pas autorisé(e) à apporter des exemplaires des œuvres que vous avez étudiées dans la salle d’examen.
- Le nombre maximum de points pour cette épreuve d’examen est de **[25 points]**.

## Instrucciones para los alumnos

- No abra esta prueba hasta que se lo autoricen.
- Conteste una sola pregunta de redacción. Base su respuesta en al menos dos de las obras estudiadas de la parte 3, comparándolas y contrastándolas en relación con la pregunta. Las respuestas que no se basen en al menos dos obras de la parte 3 no recibirán una puntuación alta.
- No está permitido traer copias de las obras estudiadas a la sala de examen.
- La puntuación máxima para esta prueba de examen es **[25 puntos]**.



2216 – 0180
© International Baccalaureate Organization 2016

International Baccalaureate
Baccalauréat International
Bachillerato Internacional

පහත සඳහන් ප්‍රශ්න අතුරින් **එක් ප්‍රශ්නයකට** පමණක් පිළිතුරු සපයන්න. 3 වන කොටසේ දී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් **යටත් පිරිසෙයින් දෙකක් වත්** ඔබේ පිළිතුරට පදනම් විය යුතු වන අතර ප්‍රශ්නයට අදාළ වන සේ එම කෘති **සන්සන්දනාත්මක ව විමර්ශනය කළ යුතුය**. 3 වන කොටසෙන් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොට ගෙන **නොමැති** පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.

**සම්භාව්‍ය සාහිත්‍යය**

**1.** "බණ දෙසීමත්, කතා කීමත් යන අරමුණු දෙකම සම්බන්ධයෙන් සිංහල ගද්‍ය රචකයන්ගේ අවධානය යොමු වී ඇත." ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

**2.** පාඨකයා තුළ ශ්‍රද්ධා භක්තිය ඇති කිරීමට සම්භාව්‍ය සිංහල ගද්‍ය රචකයන් යොදාගත් උපක්‍රම කවරේදැයි ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.

**3.** සාහිත්‍ය නිර්මාණ පොදු ජනයා වෙත සමීප කිරීම සඳහා සම්භාව්‍ය සිංහල සාහිත්‍ය රචකයන් විසින් යොදාගනු ලැබූ සාහිත්‍ය උපක්‍රම ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

**නාට්‍යය**

**4.** සැම තරාතිරකම ප්‍රේක්ෂකයන්ගේ අවධානය දිනා ගැනීමට ශෛලිගත සම්ප්‍රදාය අනුගමනය කළ සිංහල නාට්‍ය රචකයන් යොදාගනු ලැබූ උපක්‍රම ඔබ නරඹා ඇති හෝ හදාරා ඇති කෘති දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.

**5.** නූතන සිංහල නාට්‍ය රචකයන් ඔවුන්ගේ නිර්මාණ සඳහා පැරණි කතා හා පුරාණෝක්ති කවර ආකාරයෙන් නැවත යොදාගෙන ඇත්දැයි ඔබ නරඹා ඇති හෝ හදාරා ඇති නාට්‍ය දෙකක් ඇසුරින් විස්තර කරන්න.

**6.** නාට්‍යමය අවස්ථා සඳහා නාට්‍ය රචකයන් චරිත දෙකක් අතර සංවාද උපයෝගී කර ගන්නා ආකාරය ඔබ නරඹා ඇති හෝ හදාරා ඇති නාට්‍ය දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

**නවකථාව**

**7.** සමකාලීන සමාජ වටපිටාව නිරූපණය කිරීමට නවකථාකරුවන් යොදාගෙන ඇති සාහිත්‍ය විධික්‍රම ඔබ හදාරා ඇති නවකථා දෙකක් ඇසුරින් විමසන්න.

**8.** ඔබ හදාරා ඇති නවකතා දෙකක් ඇසුරෙන් නවකථාකරුවා සිය කෘතිවල භාෂාව හා ආඛ්‍යාන රටාව යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.

**9.** සිංහල නවකථාවේ වස්තු විෂයට අදාළ ලක්ෂණ ඔබ හදාරා ඇති නවකතා දෙකක් ඇසුරින් විමසන්න.

**නූතන පද්‍ය**

**10.** තත්කාලින සමාජ ප්‍රශ්න දෙස සානුකම්පිකව බැලිමට නූතන සිංහල කවීන් භාවිත කර ඇති කාව්‍ය උපක්‍රම ඔබ හදාරා ඇති පද්‍ය නිර්මාණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

**11.** කවියා තම අත්දැකීම් නිර්මාණාත්මකව යොදා ගැනීමේ දී උපයෝගි කර ගන්නා භාෂාවේ විශේෂතා පිළිබඳව ඔබ හදාරා ඇති පද්‍ය නිර්මාණ දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.

**12.** "නූතන කවීහු විවිධ කාව්‍ය විධික්‍රම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළහ." ඔබ හදාරා ඇති පද්‍ය නිර්මාණ දෙකක් ඇසුරින් විමසන්න.

**කෙටිකතාව**

**13.** "සාමාන්‍යයෙන් කෙටිකතාවක් චරිත සුළු සංඛ්‍යාවක් හා කෙටි කාල සීමාවක් ආවරණය කරයි." ඔබ හදාරා ඇති සිංහල කෙටිකතා දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

**14.** සංකීර්ණ මානව සම්බන්ධතා ප්‍රතිනිර්මාණය කිරිමට නූතන සිංහල කෙටිකතාකරුවන් දක්වා ඇති සාමර්ථ්‍යය ඔබ හදාරා ඇති කෙටිකතා දෙකක් ඇසුරින් විමසන්න.

**15.** සිංහල කෙටිකතාකරුවන්ගේ ආඛ්‍යාන රීතියට අදාළ විශේෂ ලක්ෂණ ඔබ හදාරා ඇති සිංහල කෙටිකතා දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.